**ශීර්ෂය 328 - මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 328 - මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 02 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 අප්‍රේල් 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.
මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම් ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සඳහා අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 බැරකම් හා බැදීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 01 ඡේදය පරිදි 2017 වර්ෂයේ සිට වාර්ෂික විසර්ජන පනත මගින් සලසා දෙනු ලබන ප්‍රතිපාදන ප්‍රශස්ථ මට්ටමින් උපයෝජනය කිරීම හා අනුමත ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා බැදීම් හා බැරකම්වලට නොඑළඹිය යුතු වුවත් වැය විෂයන් 4 කට අදාලව රු.1,204,997 ක ප්‍රතිපාදනය ඉක්මවා බැදීම්වලට එළඹී තිබුණි. | වාර්ෂිකව සත්‍ය වියදම් ප්‍රතිපාදන සීමාව ඉක්මවා නොයන පරිදි ඉදිරියේදී කටයුතු කිරීමට නිළධාරීන්ට උපදෙස් දී ඇත. | චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

### 2.2 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු බවට අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර | අදහස් දක්වා නොමැත | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට්පත්‍ර අංක 1640/31 අනුව කම්කරු සබඳතා හා මිනිස්බල අමාත්‍යාංශය යටතේ මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව ස්ථාපනය කිරීම 2010 ජනවාරි 01 දින සිදුකලද, එහි මූලික අරමුණ වූ "මිනිස්බල හා රැකීරක්ෂා ප්‍රතිපත්තියක් සකස් කර ක්‍රියාත්මක කිරීම" යන මූලික අරමුණ ඉටුකර ගැනීමට 2022 වර්ෂය වන විටත් නොහැකි වී තිබුණි. | වාර්ෂිකව වැඩසටහන් ක්‍රියාත්මක කරන අතර ප්‍රතිපත්ති සම්පාදනය කර වසර 5 ක් ඉක්මවා ඇති අතර නැවත සංශෝධනයට අවශ්‍ය ප්‍රතිචාර ලැබී නොමැත. | ආයතන ස්ථාපිත කිරීමේ මූලික අරමුණ ඉටුකර ගැනීමට ක්‍රියාකල යුතු වීම. |
| (ආ) | දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී සැලැස්ම අනුව ශ්‍රම වෙළඳපොල තොරතුරු රැස්කිරීමේ ක්‍රියාවලිය ඉටුකර ගැනීමට තොරතුරු පද්ධතියක් (One system software) නිර්මාණය කිරීම සඳහා 2022 වර්ෂයේදී රු.1,700,000 ක ප්‍රතිපාදිත මුදලින් දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය වෙනුවෙන් සහ සර්වර් පද්ධතිය වෙනුවෙන් එකතුව රු.672,900 ක් වැය කර තිබුණද අපේක්ෂිත තොරතුරු පද්ධතිය නිර්මාණය කිරිමේ කාර්යය ඉටුකර ගැනීමට නොහැකිව පැවතුණි. | Smart Sri Lanka ව්‍යාපෘතිය පමණක් ක්‍රියාත්මක වී නොමැත. | සැලසුම් කරන ලද ක්‍රියාවන් ඉටු කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | රැකියා පියස වැඩසටහන යටතේ වූ කොරියානු ජනරජයේ රැකීරක්ෂා හා කම්කරු අමාත්‍යාංශය විසින් කොරියානු - ශ්‍රී ලංකා ප්‍රතිපත්ති උපදේශනාත්මක වැඩසටහනට අදාල ව්‍යාපෘතිය සේවා නියුක්ති ප්‍රතිපත්ති සහ ශ්‍රම වෙළඳපොල සක්‍රීය කරන සටහන් මහජන රැකියා සේවා සංවිධානය කිරීම, ව්‍යුහය හා වැඩසටහන් පිළිබඳ ඵලදායී ක්‍රමවේද හුවමාරු කිරීම යන ක්ෂේත්‍ර යටතේ 2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක වී තිබුණි. මෙම ව්‍යාපෘතියේ යෝග්‍යතාවය පිළිබඳව මොරටුව විශ්ව විද්‍යාලය හරහා ප්‍රගති වාර්තාවක් ලබාගැනීමට යෝජනා වී තිබුනද මෙම වාර්තාවේ දින වන විටත් ප්‍රගති වාර්තාක් ඉදිරිපත් නොවීය. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය තාක්ෂණික සහාය ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ නියෝජිතායතනයෙන් ලබාදී ඇත. | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාල ප්‍රගති වාර්තා ලබා ගැනීමට කටයුතු කල යුතුය. |

## 3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ශ්‍රම වෙළඳපොල තොරතුරු රැස්කිරීම පදනම් කර ජනාධිපති කාර්යාලය මගින් දෙපාර්තමේන්තුවට යොමුකරන ලද තරුණ මානව සම්පත් දත්ත බැංකුවක් ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතියේ (ස්මාර්ට් ශ්‍රී ලංකා ව්‍යාපෘතිය) ප්‍රගතිය සම්බන්ධයෙන් මොරටුව විශ්ව විද්‍යාලය මගින් කරන ලද පරීක්ෂණ වාර්තාවේ ඇතුලත් නිරීක්ෂණ අනුව පද්ධතිය මගින් අපේක්ෂිත අරමුණු ඉටු කරගත නොහැකි බැවින් මෘදුකාංගය ස්ථාපිත කිරීමේ අරමුණු ළඟා කර ගැනීමට නොහැකි වී තිබුණි. මෙම ව්‍යාපෘති සඳහා සමාලෝචිත වර්ෂය වන විට දෙපාර්තමේන්තුව විසින් 2021 හා 2022 වර්ෂවලදී රු.84,082,617 ක වියදමක් දරා තිබූ අතර පරිගණක උපාංග, ගෘහ උපකරණ හා ලිබඩු මිලදී ගැනීම සඳහා ඉහත ව්‍යාපෘති යටතේ රු.83,582,617 ක් වැයකර තිබුණි. | රට තුල පැවති විවිධ අර්බුද හේතුවෙන් පොදුවේ මහජනතාව මෙන්ම රාජ්‍ය ආයතනවලටද බලපෑම් ඇති කරන ලදී. | අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා ගැනීමට කටයුතු කල යුතුය. |

**3.3 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රැකියා අපේක්ෂකයන් පිළිබඳ තොරතුරු රැස්කිරීම හා රැකියාගත කිරීම පිළිබඳ 2018–2022 දක්වා කාලවකවානුවෙහි රු.11,372,667 ක මුදලා පිරිවැයක් දරා තිබූ නමුත් රැකියා අපේක්ෂකයන් රැකියාගත කිරීම සියයට 10– 16 අතර පරාසයක විය. එම රැකියාගත කිරීම්වල නිරතවීම පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයක් නොමැති බව නිරීක්ෂණය විය. | රට තුල පැවති විවිධ අර්බුද හේතුවෙන් පොදුවේ මහජනතාව මෙන්ම රාජ්‍ය ආයතනවලටද බලපෑම් ඇති කරන ලදී. | රැකියා අපේක්ෂකයන් පිළිබඳ තොරතුරු රැස්කිරීම හා රැකියාගත කිරීමට කටයුතු කළ යුතුය. |

**3.4 විදේශ ආධාර ව්‍යාපෘති**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකාවේ විගමණික ශ්‍රමිකයින්ට සහාය වීම තුලින් රාජ්‍ය රැකියා සේවය ශක්තිමත් කිරීම සඳහා වන ව්‍යාපෘතිය වෙනුවෙන් මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවට රු.6,066,000 ක මුදලක් ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO) විසින් ලබාදී තිබුණි. මෙම මුදල් ප්‍රතිපාදන වැයකර ජාතික යොවුන් සේනාංකය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙතින් රාජ්‍ය රැකියා සේවය ශක්තිමත් කිරීම උදෙසා සිදුකරන ලද වැඩසටහන්වල ප්‍රගතිය විගණනය වෙත ඉදිරිපත් නොවිය. | ශ්‍රී ලංකාවේ විගමනික ශ්‍රමිකයින්ට සහයවීම තුලින් රැකියා සේවය ශක්තිමත් කිරීමට ලබාදුන් ආධාර මුදල සම්බන්ධව යොවුන් සේනාංකය හා දෙපාර්තමේන්තුව හවුල්කරුවෙකු ලෙස ක්‍රියාකරන ලදී. | වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පසු විපරම් කල යුතුය. |

**3.5 ප්‍රසම්පාදනයන්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වඩාත් කාර්යක්ෂම ලෙස සේවා සැපයීමේ අරමුණින් තොරතුරු තාක්ෂණික පද්ධතියක් සඳහා රු.4,933,440 ක ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.<br><br>(i) ආයතනය තෝරා ගැනීමේදී මිල ගණන් කැඳවීම, මිල ගණන් විවෘත කිරීමේදී අදාල ලියවිලි සම්පූර්ණ කර නොතිබීම, ආයතනය තෝරා ගත් ආකාරය හා පදනම පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය.<br><br>(ii) 2021 දෙසැම්බර් මස වන විට අදියර දෙකක් යටතේ ගෙවීම් සිදුකර තිබුණු අතර මෙම පද්ධතිය මඟින් සැලසුම් සකස් කිරීම, කාර්මික වෙළඳපල තොරතුරු සකස් කිරීම, නිවාඩු ලේඛණ සැකසීම, පෞද්ගලික ලිපිගොනු සැකසීම, පුහුණු කටයුතු, වැය කළමණාකරණය, වාහන කළමණාකරණ හා ස්ථාන මාරු කළමණාකරණය යන අංශ සිදු කිරීමට නියමිතව තිබුණද මෙම වාර්තාව නිකුත් කරන දිනය වන විටත් අපේක්ෂිත තොරතුරු පද්ධතිය හරහා ලබා ගැනිමට නොහැකි වී තිබුණි.<br><br>(iii) තෝරාගත් ලංසුකරු සමඟ එළඹි ගිවිසුමෙහි තොරතුරු තාක්ෂණ පද්ධතිය සකස් කර නිම කල යුතු දිනය සඳහන්ව නොතිබූ අතර නිශ්චිත කාලරාමුවක් නොමැතිවීම මඟින් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීම ප්‍රමාද වන බව නිරීක්ෂණය විය. | 2022 වර්ෂයේ රටතුල පැවති කොවිඩ් හා අර්බුදකාරී තත්ත්වය මත කාර්යාල කටයුතු අඩපණවීම මත ප්‍රමාද විය. | තොරතුරු තාක්ෂණ පද්ධතිය ස්ථාපිත කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.6 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව සතු මූල්‍ය නොවන වත්කම් බෙදාහැරීමේදී 2019 ජනවාරි මස සිට අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට නිකුතු නියෝග මගින් ලබාදී තිබූ රු.4,457,864 ක් වටිනා වත්කම් සඳහා ලැබීම් නියෝග 2023 පෙබරවාරි මාසය වන විටත් ලැබී නොතිබුණි. | ලැබීම් නියෝග පිළිබඳව සොයා බලා කටයුතු කරන ලෙස දැනුවත් කර ඇත. | ලැබීම් නියෝග ලබාගෙන වත්කම්වල අයිතිය නිරවුල් කරගත යුතුය. |
| (ආ) | 2021 ජනවාරි 29 දින දෙපර්තමේන්තුව වෙත ලැබුණු නිසාන් වර්ගයේ මිනි වෑන් රථය අළුත්වැඩියා සහ නඩත්තු සඳහා රු.497,791 ක මුදලක් වැයකර තිබූ නමුත්, ලියාපදිංචි කරගැනීමේ කටයුතු සිදුකර ගැනීමට නොහැකි වීම නිසා ධාවනයෙහි යොදවා නොතිබුණි. | මුදල් ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් ලියාපදිංචි කර ගැනීම් සිදුකර ගත නොහැකි වී ඇත. | වත්කම් අත්පත් කර ගැනීම හා කළමණාකරණය නිරවුල් කරගත යුතුය. |

## 3.7 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 (1)(ඊ) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරියෙකු සහ ගණන්දීමේ නිලධාරියෙකුගේ වගකීම් යටතේ අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් ඇති බවට සහතික විය යුතු වුවත් දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර නිලධාරී තනතුර වසර කිහිපයක් තිස්සේ පුරප්පාඩුව පැවතීමෙන් එම කර්තව්‍ය නිසි පරිදි සිදු වී ඇතිද යන්න පිළිබඳව ගැටළු සහගත විය. | පුරප්පාඩු සඳහා ඉල්ලීම් කර ඇතත් ප්‍රමුඛතාවය ලැබී නොමැත. | අභ්‍යන්තර විගණනය ශක්තිමත් කිරීමට ක්‍රියාකල යුතුය. |